**පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව - 2021**

**--------------------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

**------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කුඩත්තනෙයි උප කාර්යාලයේ තිබූ රු. 476,373 ක් වටිනා 4H ගේඩර් තොග ගිණුම්ගත කර නොතිබීමෙන් ජංගම වත්කම් සහ සමුච්චිත අරමුදල මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | ඒ සඳහා වෙනම ලේඛනයක් පවත්වා ගෙන යනු ලැබේ. | නිවැරදි තොග වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- |
| | | රු. | | | |
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සුසාන භූමි 04 ක. | 24,772,495 | අයිතිය තහවුරු කිරීමේ ලියවිලි | පිඹුරුපත් අනුව සංවර්ධන වැඩ කටයුතු ක්‍රියාත්මක කර ඇත. පවරා ගැනීමට අවශ්‍ය කටයුතු ආරම්භ කළද, මෙතෙක් නිමවී නැත. | අදාල කරුණු සම්බන්ධයෙන් කඩිනමින් කටුයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සිදුකල සංවර්ධන වැඩ. | 40,606,760 | ප්‍රාග්ධන සංවර්ධන වැඩ සම්බන්ධ විස්තර | සභා අරමුදලින් වෙන්කරන ලද රු. 27,530,278 ක ප්‍රතිපාදනට අදාල සංවර්ධන වැඩ සභා තීරණ 22/24.02.2022 අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට තීර්ණය කර ඇත. | අදාල කරුණු සම්බන්ධයෙන් කඩිනමින් කටුයුතු කළ යුතුය. |
| (ඇ) | 1987 හි අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134(i) අනුව සභා බලප්‍රදේශයේ තිබෙන ඉඩම්, ඉදිකරන ලද නිවාස සහ ගොඩනැගිලි වලින් අයවිය යුතු වරිපනම් බදු. | 1,110,847 | හිඟ ආදායම් පිළිබඳ කාල විශ්ලේෂනය | හිඟ වරිපනම් බදු අයකිරීම් සම්බන්ධයෙන් ජංගම සේවා පවත්වා ගෙන යන අවස්ථාවේදී කෝවිඩ් 19 හේතුවෙන් මහජන ගමනාගමනය සීමාවීමෙන් වරිපනම් බදු අයවීම අඩුවී තිබුණි. | අදාල නීති ප්‍රතිපාදනය අනුව කටයුතු කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම**

**1.7.1 කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත වගන්තිය 158(1) | වර්ෂ 01 – 05 දක්වා හිඟ වරිපනම් බදු ගෙවීම පැහැර හැර තිබූ අයවලුන්ට එරෙහිව ලේකම් විසින් වරෙන්තු නිකුත්කර නොතිබුණි. | ලේඛනයේ තිබෙන නම්වලට වරෙන්තු නිකුත්කළ අයිතිකරු නොමැති වීමෙන් වරෙන්තු භාරදීමට නොහැකිව ඇත. දැනට තක්සේරු කටයුතු නිමකර ඇත. නව තක්සේරු වටිනාකම ලැබීමෙන් අනතුරුව වරෙන්තු නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාල නීති රීති අනුව කටයුතු කිරීම් සිදු කළ යුතුය. |
| (ආ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශයේ 2018.01.24 දිනැති අංක 05/2018 දරන චක්‍රලේඛය | ඉකුත් වර්ෂ 03 ක කාලයතුල කාර්ය මාණ්ඩල සඳහා වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණුවක් ලබා දී නොතිබුණි. | කළමනාකරණය සංවර්ධන පුහුණු ආයතනය විසින් පවත්වන පුහුණු සඳහා නිලධාරීන් සහභාගී වී ඇත. ලැයිස්තු ගත නොකර සේවකයන් සඳහාවූ පුහුණුව කෝවිඩ් - 19 හේතුවෙන් පැවැත්වීමට නොහැකි විය. | චක්‍රලේඛය විධිවිධාන අනුව කටයුතු කිරීම නියමිත කාල පරච්ඡේදයේ පැවැත්වීම සනාථ කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 42,348,978 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.28,688,564 ක් විය.

**2.2 ආදායම් පරිපාලන**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දක්වා ඇත.

| | විගණන නිරීකෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ------------------------- | ------------ |
| (අ) | **වරිපනම්**<br>සමාලෝචිත වර්ෂයේ ලැයිස්තු ගත වරිපනම් ආදායම රු. 149,087 ක් ලෙස දක්වා තිබුණද, ඉන් රු. 64,335 ක මුදලක් අයකර නොතිබුණි. | රටේ පැවති අසාමාන්‍ය තත්ත්වය හේතුවෙන් මහජනයා බදු ගෙවීම සඳහා උනන්දුවක් දක්වා නොතිබුණි. තවද, ජංගම සේවාව ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | අදායම් රැස්කිරීමේ කළමනාකරණය ඵලදායීව සිදුකර හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර අදාල හිඟ මුදල් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම කඩිනම් කළ යුතුය. |
| (ආ) | **කුලී**<br>සමාලෝචිත වර්ෂ අවසානයේ වර්ෂ 01 සිට 08 දක්වාවූ කාලයට අයත් රු. 294,005 ක් වටිනා හිඟ කඩකුලී අයවීමට තිබුණි. තවද, සභාව විසින් දීර්ඝ කාලීනව බදු දෙන දේපළ වලින් කඩ කාමර 06 ක ගිවිසුම් අළුත් කළ යුතුවූවද, ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොමැති බව විගණනයේදි හෙළිදරව් විය. | රු. 118,440 ක් වටිනා හිඟ බදු කුලී 2008, 2011, 2013 සහ 2014 වර්ෂවලට අයත් ශේෂය සහා අනුමැතිය ලබා කපා හැරීමට කටයුතු කරමි.<br>තවද, 2021 වර්ෂයේ හිඟ බදු කුලී කොරෝනා කාලයට අයත්වන අතර එය කපා හැරීම සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී ඇත.<br>තක්සේරු කිරීමෙන් පසු ගිවිසුම් අළුත් කිරීමද, අළුත් නොකළ ගිවිසුම් සඳහා ඉදිරි ක්‍රියාමාර්ගයද කරනු ලැබේ. | අදාල හිඟ මුදල් සම්බන්ධයෙන් කටයුතු කිරීම කඩිනම් කළයුතු අතර ගිවිසුම් සඳහාවූ කාල පරිච්ඡේදය අනුව කාලය දීර්ඝ කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------- | -------------------------- | ------------- |
| සභා සතු දේපළවලින් පුලෝලි උප කාර්යාලයට අයත් දේපළ 7320 ක තක්සේරුව 1972 වර්ෂයෙන් පසු තක්සේරු කර නොතිබුණි. තවද, සෙම්පියන්පට්රු උප කාර්යාලයට අයත් දේපළ 2419 ක් සහ කුඩත්තනේ උපකාර්යාලයට අයත් දේපළ 1567 ක් සඳහා තක්සේරු කිරීම් මෙතෙක් සිදුකර නොතිබුණි. | 2019 වර්ෂයේ සභාව සතු දේපළ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කරන ලදි. එසේවූවද, තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වාර්තාව අප වෙත මෙතෙක් ලැබී නොමැත.<br>සංවර්ධනයවූ ප්‍රදේශ ලෙස 2017.11.10 දින ගැසට්පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලදි. අදාල තක්සේරු වාර්තා ලැබීමෙන් පසු පුලෝලි, සෙම්පියන්පටුරු, කුඩත්තනේ බල ප්‍රදේශයන්ට අයත් දේපළවල වරිපනම් බදු අයකිරීමට අවශ්‍ය තක්සේරු කිරීමට කටයුතු කර ඇත. | අදාල කාලයතුල වත්කම් තක්සේරු කර ගිණුම්වල දැක්විය යුතු අතර, අදාල දේපළ සඳහා වරිපනම් අයකළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව සතු රු. 18,224,179 ක් වටිනා බර වාහන යොදවා ආදායම් උපයා ගැනීම සඳහා වර්ෂ 05 ක කාලයක සිට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | Lorry Gully Bowser (S) and Tractor Gully Bowser 02 යන වාහන අපද්‍රව්‍ය බැහැර කිරීමට සුදුසු ස්ථානයක් නොමැති බැවින් එම සේවය ක්‍රියාත්මක කිරීමට නොහැකිව ඇත. | අදාල වාහන යොදවා සභාවේ ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මතභේදයෙන් තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂයේ සභාව විසින් ක්‍රියාත්මක කළ ශාන්දවත්ත පොල සහ මනටිකාඩු ගවමස් වෙළඳ සැල ප්‍රතිසංස්කරණය කිරීම යන සංවර්ධන වැඩ 02 ක් සඳහා රු. 333,685 ක් සභාව සතු නොවන ඉඩමක ක්‍රියාත්මක කර තිබුණද අදාල ඉඩම පවරාගෙන නොතිබුණි. | රජය සතු ඉඩම සභාවේ නමට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | මේ සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු සිදු කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **භාර නොගත් වත්කම්** | | |
| සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන වාහන 06 ක් සහ සභා බල ප්‍රදේශයේ තිබෙන සුසාන භූමි 33 ක් සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල වාහන 06 විවිධ හේතූන් මත ලියාපදිංචි කිරීමට නොහැකිව ඇත. | මේ සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු සිදු කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව විසින් ගිවිසුම් අත්සන්කල රු. 8,362,592 ක් වටිනා ව්‍යාපෘති 04 ක් ගිවිසුම් කාලය නිමවී ඇතත්, ක්ශේත්‍ර පරීක්ෂණයේදි වැඩ ආරම්භ කර නොතිබු බව නිරීක්ෂණය විය. මෙම ව්‍යාපෘතින් විගණන දිනය දක්වා ආරම්භ කර නොතිබුණද, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශක 2.11.4 (අ) හි සඳහන් කාර්යයන් සහ ඉදිරිකිරීම් කාර්මාන්ත සංවර්ධන අධිකාරියේ මාර්ගොපදේශක අත්පොත (CIDA) 11 වනි වගන්තියේ සඳහන් කරුණුවලට අනුකූලව විසින් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු එවා නැත. | මේ සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු සිදු කළ යුතුය. |

## 3.6 වාහන පාලනය

------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වාහන උපයෝජනය** | | |
| සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන වාහන 02 ක් සම්බන්ධයෙන් 02/2015 මුදල් චක්‍රලේඛය අනුව 2019 වර්ෂ සිට කටයුතු කර නොතිබුණි. | UNHCR විසින් පවරා ගැනීමට අවශ්‍යා ලියවිලි ඉදිරිපත් කිරීමෙන් පසු පවරා ගැනීමට කටයුතු කරමි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කඩිනමින් කටයුතු කළ යුතුය. |